1 වන පිටුවෙන්.....

# යුරෝපය කඩා වැටේ?

ආර්ථික අපහසුතාවන්ට මුහුණ පෑ බව කියති. ප්‍රතිකර්මයක් ලෙස වියදම් කපා හැර සකසුරුවම් වන්නට යයි දුන් උපදෙසට ග්‍රීසියේ ජනතාව කැමති වුණේ නැත. ඒ නිසා දැනට මාස දෙකකට පෙර පැවති මැතිවරණයේදී දක්ෂිනාංශික පක්ෂයක් වියදම් කපා හැරීම් හෝ සකසුරුවම්කම් පැත්තකට දා අතදිග හැර වියදම්කරමින් ජනතා සුබ සිද්ධිය සඳහා කැප වෙනවා යයි කී නිසා ජනතාව ඔවුන්ට ඡන්ද දී මැතිවරණයෙන් ජයග්‍රහණය කරවූහ. නමුත් ඒ බලයට පත් පක්ෂයට ස්ථාවර රජයක් පිහිටුවන්නට තරම් ආසන සංඛ්‍යාවක් නොලැබුණ නිසා තැනූ විගසම එය කඩා වැටුණෙන් දැන් යළිත් මැතිවරණයකට යන්නට ග්‍රීසිය සූදානම් වෙයි. එය මේ ජුනි 17 වන දින පවත්වන්නට නියමිතය.

## ප්‍රශ්නය මෙයයි !
## යූරෝ කලාපයේ ඉන්නවාද? නැත්නම් ඉවත්වී යනවාද?

උපදෙස් පරිදි සකසුරුවම් ක්‍රම සහ විධි භාවිතා නොකරන්නේ නම් ග්‍රීසියට යූරෝ මුදල් නෝට්ටුව අත හැර ඔවුන්ගේ පෙර පැවති ඩ්‍රැක්මා නම් නෝට්ටුව භාවිතා කරන්නට සිදුවෙනවා ඇත. එසේ වීමෙන් යූරෝ කලාපයෙන් ද ග්‍රීසියට ඉවත්වීමට සිදුවන්නේය. ග්‍රීසියේ මැතිවරණය එක අතකට ජනමත විචාරීමක් වැනිය. එනම් වියදම් කපා හරිමින්, සකසුරුවම් ක්‍රම භාවිතා කරමින් යූරෝ කලාපයේ දිගටම රැඳී සිටිනවාද, එසේ නැත්නම් යූරෝ කලාපයෙන් අයින් වී ආර්ථික වශයෙන් අවිනිශ්චිත අනාගතයකට ග්‍රීසිය මුහුණ දෙනවා ද යන්නයි.

මේ ප්‍රශ්නයම අයර්ලන්ත ජන රජයේ නොබෝදා මතුවුණි. සති දෙකකට පෙර අයර්ලන්තයේ ජනමත විචාරණයක් පැවැත්වුණේ රජය යූරෝ කලාපයේ සිටිනවාද නැත්නම් එයින් අයින් වෙනවාද යන්න නිශ්චය කරගැන්මටය. ජුනි 1 දා පැවති එම ජනමත විචාරණයේදී ජනතාව බහුතරයක් ඡන්දය දුන්නේ කලාපයේ හිඳීම සුදුසුය යන්න තහවුරු කරන්නටය.

යූරෝ කලාපයේ ආර්ථික විපතට වැටී ඇති තවත් රටක් නම් ස්පාඤ්ඤය යි. අවුරුදු දෙකකට පෙර එම රටේ ගොඩනැගිලි කර්මාන්තය ඉතා සරුසාරව ක්‍රියාත්මක වීය. බැංකු වලින් ණය ගනිමින් සාදන ලද සුන්දර නිවාස සංකීර්ණ හා වෙළඳ ශාලා ආදියේ නිමක් නොවීය. එහෙත් හදිසියේ නිවාස වෙළඳපළ කඩා වැටුණෙන් නිවාස අගය ඉතා පහතට බැස්සේය. විකුණා ගන්නට බැරි නිවාස හා දේපළ 800000 කට වඩා ස්පාඤ්ඤයේ බැංකු සතුව ඇත. ඒවා සඳහා දුන් ණය පාරිභෝගිකයන් ගෙන් ලබා ගන්නට නොහැකි තත්වයක් පවතී. ආර්ථිකය කඩාවැටී ඇත. ස්පාඤ්ඤයට ද වැටුණු වලෙන් ගොඩ එන්නට සකසුරුවම් ක්‍රම භාවිතා කරන්නට සිදුව තිබේ.

ආර්ථික අවිනිශ්චිත තත්වය මනින්නට තවත් හොඳ සාධකයක් නම් යම් රටක ඇති විරැකියා ප්‍රමාණය දෙස බැලීමයි. වයස 16 -24 අතර රැකියා නැති සංඛ්‍යාව ස්පාඤ්ඤයේ 50%කි. පෘතුගාලයේ 35% කි. අයර්ලන්තයේ 32% කි.

## ඉතා අයහපත් තත්වයක්

ආර්ථික ප්‍රකාශකයන් පෙන්නුම් කරන පරිදි යුරෝපීය හවුලේ දකුණු දිසාවේ රටවල් අතිශය අමාරුවට වැටී ඇති අතර ඉන් ගොඩ ඒමට වියදම් කපා සකසුරුවම් පිළිවෙතක් අනුගමනය කරමින්ම සාමාන්‍ය එදිනෙදා කටයුතුවලද නිරත වන්නට එවුනට සිදුව ඇත.

එහෙත් අනෙක් පැතිවල ඇති රටවල්, විශේෂයෙන් ජර්මණිය හා ඔස්ට්‍රියාව දෙරටේ ආර්ථිකයන් සාමාන්‍ය ලෙස කරදරයකින් තොරව ක්‍රියාත්මක වෙයි. උදාහරණයක් ලෙස ඔස්ට්‍රියාවේ රැකියා හිඟය 4% කි. එය යුරෝපයේ අඩුවෙන්ම ඇති රටයි. ජර්මනියේ 5.7% කි. මේ දෙරට ආර්ථික අතින් ඉතා ශක්තිමත්ය. මේ අසමාන කම් යුරෝපීය සංගමයේ ඇත. ඊට හේතුව ඒ රටවල් එක ආර්ථිකයක් ලෙස හවුලේ එකට සිටියත් තමා අයත් රටේ පවතින දේශපාලන පක්ෂවල අදහස් වලට ද අවනත ක්‍රියා කරන්නට ද ඔවුනට නිදහස ඇති නිසාය. එසේ ක්‍රියා කිරීමේදී තම රටවල බලයට එන එක එක දේශපාලන පක්ෂ ගන්නා අනුවන පියවරවල්හි විපාක ද තමන්ට විඳින්නට සිදුවන්නේය. මෙහිදී යුරෝපීය මධ්‍යම බැංකුවට The European Central Bank (ECB)උදව්වක් කළ හැක්කේ එක්තරා ප්‍රමාණයකට පමණය.

ළඟදී පවත්වන්නට නියමිත මැතිවරණයේදී ග්‍රීසියේ ජනතාව දක්ෂිණාංෂික රජයක් බලයට පත්කර ගතහොත් ග්‍රීසියට යුරෝපා හවුලෙන් ඉවත්වන්නට සිදුවන අතර එය බැරෑරුම් ආර්ථික කඩාවැටීමකට මුහුණදීමක් වෙනවා ඇත. එවැනි කඩාවැටීමක් එක්සත් රාජධානියට ද ඉතා අහිතකර වන්නේය. මක්නිසාද එක්සත් රාජධානිය සිය වෙළඳ ගණුදෙණු බොහොමයක් පවත්වාගෙන යන්නේ යුරෙෝපා සංගමයේ රටවල් සමග බැවිනි. බ්‍රිතාන්‍යය දැනටත් මුහුණ පා සිටින ආර්ථික වැටීමට අමතරව වෙළඳ ගණුදෙණු කඩා වැටී තවත් ආර්ථික අවපාතයකට හේතු වුවහොත් එය දරාගන්නට නොහැකි වෙනවා ඇත. ඇමරිකාව ද මෙහිදී බියට පත්ව සිටින්නේ ඔවුන්ගේ ආර්ථිකයට ද මේ සියල්ල බලපාන බැවිනි. යුරෝපය වැටෙ නවාට ඇමරිකාව කැමති නැත. පසුගිය මාසයේ ඇමරිකාවේ පැවති රටවල් 8 ක ආර්ථික සමුළුවේදී (G8 Summit) ඇමරිකානු ජනාධිපති ඔබාමා ජර්මන් නියෝජිතවරියගෙන් ඉල්ලා සිටියේ ග්‍රීසිය ආර්ථිකව වැටෙන්නට නොදී ඊට උදව්කරන ලෙස ය.

## ලංකාවට බලපාන හැටි !

යුරෝපයේ ආර්ථික කඩාවැටීම ලංකාවට කෙසේ බලපානු ඇද්ද?

මෑතක කළ වෙළඳ ගනුදෙණු මගින් එය වටහා ගත හැකිය. 2009 ශ්‍රීලංකාවේ වෙළඳ කටයුතු විමර්ශනයක් දක්වන්නේ යුරෝපා සංගමය අපට සිටින ශක්තිමත් ගණුදෙනුකරුවෙකු බවයි. එම වසරේදී ශ්‍රීලංකාව යූරෝ බිලියන 2.06 ( රුපියල් බිලියන 309) භාණ්ඩ ඔවුන්ට අපනයනය කර ඇත. එය අපේ මුලු අපනයන වලින් 39% කි. එසේම එම වසරේදී යූරෝ බිලියන 1.1 (රුපියල් බිලියන 165 ) භාණ්ඩ ඔවුන්ගෙන් අප රටට ගෙන්වා ගෙන ඇත. එය මුළු ආනයන ප්‍රමාණයෙන් 13.5 % කි.

ඉන්දියාව සහ චීනය ළඟට යුරෙෝපා සංගමය ශ්‍රීලංකාවට සිටින වැදගත් ආනයන ගණුදෙණුකරුවාය.

## 2011 වසරේ යූරෝ ගණුදෙණු

ශ්‍රීලංකාවෙන් යුරෝපා සංගමයේ රටවලට යූරෝ මිලියන 2377 වටිනා භාණ්ඩ අපනයනය කර ඇත. එය අපේ මුලු අපනයන වලින් 36.1 % කි.

යුරෝපා සංගමයෙන් ශ්‍රීලංකාවට ආනයනය කළ භාණ්ඩ වටිනාකම යූරෝ මිලියන 1363 ක් වන අතර එය අපේ මුළු ආනයන වලින් 11.3% කි.

මේ ඉහත සංඛ්‍යා ලේඛනවලින් දැක්වෙන්නේ යුරෝපා සංගමය සමග ගණුදෙණු කිරීමෙන් අප රට වඩාත් විදේශ විනිමය වාසි ලබන බවයි. එසේම ඉන්දියාව සමග ගනුදෙනු කරනවාට වඩා යුරෝපය සහ චීනය සමග ගණුදෙනු කිරීම අපට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ අප රටට අවශ්‍ය බර යන්ත්‍රෝප කරණ හා එහි කොටස්ද තාක්ෂණික උපකරණ සහ අවශ්‍ය ආම්පන්න අප ගෙන්වන්නේ ඔවුන්ගෙන් වන බැවිනි.

මේ නයින් බලන කල්හි යුරෝපා සංගමයේ රටවල් වල ආර්ථිකය කඩා වැටුණ හොත් එය අපේ රට ශ්‍රීලංකාවටද බලපාන අර්බුදයක් වෙනවා ඇතැයි අපට සිතාගත හැකිය.

# SF නිදහස ලැබීම



**හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතා නොබෝදා ජනපති සමාව මත නිදහස් වූයේය. ඒ නඩුව හා නිදහස්වීම ගැන නොයෙක් දෙනා නොයෙක් මත පළ කළහ. ඒ බොහෝ මත නඩුවේ ස්වභාවය හෝ රටේ බලපවත්වන නීතිය ගැන හෝ දැන කළ ප්‍රකාශ නොව ඔවුන් ගේ හිතට ආ දේවල් අනුව දැක් වූ අදහස්ය. මේ ලිපිය ඒ මත නිරවුල් කර දක්වන්නට ගත් ප්‍රයත්නයකි.**

මෑත ශ්‍රීලංකා දේශපාලන ක්ෂෙත්‍රයේ ආන්දෙෝලනාත්මක චරිතයක් බවට පත්වූ හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතා බන්ධනාගාරයෙන් නිදහස් වුණේය. පසුගිය ජනාධිපති වරණයෙන් පසු යුද හමුදා අත් අඩංගුවට පත් ඔහුට විරුද්ධව යුද්ධාධිකර ණය ඉදිරියේ නඩු තුනක් ද, සිවිල් අධිකරණයේ නඩු තුනක් ද පවරා තිබුණි.

නිතර නිතර උසාවි ගෙනයාමත්, අධිකරණ ක්‍රියාදාමයන්ට අනුව කෙරෙන මූලික විරෝධතා, අතුරු තහනම්, නියෝග, අභියාචනා මෙන්ම රෝහල් ගතකිරීමට කෙරෙන නියෝග ආදිය හා මාධ්‍ය වලට කෙරෙන ප්‍රකාශන නිසාත්, විවිධ උද්ඝෝෂණ ව්‍යාපාර නිසාත් බැලූ බැල්මට ඒ ඒ නඩුවල සැබෑ තත්වය වටහාගැන්ම අපහසුය. කුමන නඩුවේ, කුමන චෝදනා ඇද්ද යන්න හෝ කුමන නඩුවල තීන්දු දී ඇද්ද යන්න හෝ අභියාචන ඉදිරිපත්කර ඇත්තේ කුමන නඩු තීන්දු වලට එරෙහිවද යන්න හෝ සැබැවින්ම දන්නේ නීතිවේදීන් හා සරත් ෆොන්සේකා පමණි.

ඔහු බන්ධනාගාරයෙන් නිදහස් කරගැන්ම සඳහා දේශපාලන පක්ෂ හා මහජන සංවිධානද, ආගමික සංවිධානද, පවුලේ අයද නොයෙක් ව්‍යාපාර ගෙන ගියහ. පුද පූජා සහ බෝධි පූජාවල අඩුවක් නොවීය. විවිධ ලෝක සංවිධානවලටද මෙම ව්‍යාපාරය ගෙන ගියහ. ලෝක නායකයන්ටද කරුණු කීහ.

මේ පිළිබඳ අවධානයෙන් පසුවූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කියා සිටියේ සරත් ෆොන්සේකාගේ පවුලේ කෙනෙකු තමාගෙන් ඒ ඉල්ලීම කරන්නේ නම් ඒ ගැන සලකාබැලිය හැකි බවය.

ශ්‍රීලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තියට අනුව කිසියම් වරදකරුවෙකුට සමාවදීමට හෝ, දඬුවම් ලිහිල්කිරීමට හෝ, ඉදිරි දඬුවම් කාලයෙන් නිදහස් කිරීමට හෝ ජනාධිපතිවරයාට බලය පැවරී ඇත. යම්කිසි දඩ මුදලක් ගෙවීමට ඇත්නම් එය මුළුමනින්ම හෝ කොටසක් හෝ අඩුකිරීමට ද ඔහුට බලතල පැවරී ඇත.

ජනපතිවරයා සතු අභිමත බලතල ක්‍රියාත්මක කරවීමට විවිධ ව්‍යාපාර හා උද්ඝෝෂණ විවිධ පුද්ගලයින් විසින් සංවිධානය කරනු ලැබ ගෙන ගියත් මූලික ඉල්ලීම පවුලේ අය වෙතින් කෙරී නොමැත. ඒ වෙනුවට පෞද්ගලික මැදිහත් කරුවෝ (negotiators) ඉදිරිපත් වූහ. ජනාධිපති බලය ක්‍රියාත්මක කරවීමට සාකච්ඡාකරුවන් මැදිහත්වීමෙන් ව්‍යවස්ථාමය බලය හා අධිකාරිය (constirutional authority) සැහැල්ලු වන බවක් පෙනේ.

පසුගිය මැයි මස 18 දින වන විට සරත් ෆොන් සේකා නිදහස් වනු ඇතැයි මාධ්‍යවල ප්‍රචාරය විය. ඒ වන විට ඔහුට එරෙහිව තිබූ නඩුවලින් එක් නඩු තීන්දුවකට අනුව සිර දඬුවම් කාලය අවසන්වී තිබුණි. සමහර නඩු තීන්දුවලට එරෙහිව අභියාචනා ගොනුකර තිබුණි. සිර දඬුවමක් විඳින තැනැත්තෙකු ඒ තීන්දුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ විගස ඔහු සිරකරුවෙකු නොව නැවත සැකකරුවෙකු බවට පත්වේ. ඒ අනුව ෆොන්සේකා මැයි 18 වන දින බන්ධනාගාර අත් අඩංගුවේ සිටියේ සැකකරුවෙකු ලෙසිනි. සැකකරුවන්ට සමාවදීමට ජනාධිපතිවරයාට බලයක් නොමැත.

එනිසා සරත් ෆොන්සේකා තම අභියාචනය ඉල්ලා අස්කර ගත්තේය. එවිට ඔහු නැවත සිරකරුවෙකු බවට පත්විය. සිර දඬුවම් විඳින අයෙකුට 34 වන ව්‍යවස්ථා වගන්තියට අනුව ජනාධිපති බලය ක්‍රියාත්මක කළ හැකිය.

ෆොන්සේකා මහතා බන්ධනාගාරයෙන් නිදහස් වූයේ එසේය. එහෙත් ඔහුට පනවා තිබූ දඩ මුදල ගෙවීමට සිදුවූ නිසාත් එතෙක් විඳි දඬුවම් කාලය ඉවත්කර නැති නිසාත් ඔහු නිදහස ලබා ඇත්තේ කොන්දේසි සහිතව බව පෙනේ.

ශ්‍රීලංකාවේ මීට පෙර එනම් 1949 දී එවකට කතානායකව සිටි ශ්‍රීමත් ප්‍රැන්සිස් මොළමුරේට නඩුවක් නිසා සිර දඬුවමක් පැණවුණු අතර එකල නීතිය අනුව බ්‍රිතාන්‍ය කිරීටයේ (Crown) නාමයෙන් නිදහස ප්‍රදානය කරනු ලැබිණ.

මෑත කාලයේ එස්. බී. දිසානායක සිරගෙට නියමව දඬුවම් විඳිද්දී ජනාධිපතිවරයාගේ විශේෂ සමාවක් යටතේ බන්ධනාගාරයෙන් නිදහස්වීමට අවස්ථාව ලැබිණ.

වෙන්නප්පුවේ ටී. ප්‍රනාන්දු නම් කාන්තාවක්ද, රත්නපුරේ ඇන්ටන් තෙන්නකෝන් නමැත්තාද එලෙස ජනාධිපති සමාව ලද්දෝ වෙති. මීට අමතරව වෙසක් පොහෝ දින ජාතික නිදහස් දින සිංහළ අවුරුදු දින වැනි විශේෂ අවස්ථාවන්හිදී සිරකරුවන් නිදහස් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තියට අනුවය.

*ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි*
**♦ මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**



Russian President Vladimir Putin

# යුරෝපය ගොඩගැනීමට රුසියාව ඉදිරිපත් වෙයි!
## Russia to help EU overcome economic woes

Russia is ready to give a hand to the European Union (EU) over its economic woes, President Vladimir Putin said.
After the 29th Russia-EU summit, Putin told a press conference that Moscow believes the EU will finally overcome its difficulties.
“ The outlook is optimistic, and from our side also. We are ready to facilitate this process, as we are also interested in it ” Putin said. He added that any recession in Europe would have a direct impact on the Russian economy.

යුරෝපා සංගමයේ රටවල් දැන් වැටී ඇති මූල්‍ය අර්බුදයෙන් ගොඩ එන්නට රුසියාව උදව්කරන්නට කැමති බව රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් ගිය සතියේ පැවසීය. යුරෝපා හවුල ඉතා ඉක්මනින් යථා තත්වයට පත්වේයයි තමා සුබවාදීව සිතන බවද ඔහු කීවේය. යුරෝපය මුහුණ දෙන යම් ආර්ථික කරදරයක් වෙතොත් එය රුසියාවටද බලපාන බවද ඔහු පැහැදිලි කළේය.